# කෘෂිකර්ම අමාත්‍යාංශය

## කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය

ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් තරගකාරීව අලෙවි කළ හැකි වෙළඳ භාණ්ඩ නිපදවීමටත් වෙළෙඳපොළ අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීමට ඔවුන්ගේ හැකියාව වර්ධනය කර ගනිමින් වැඩි වර්ධනයවූ වාණිජ්‍යකරණයකට වේගවත්ව යොමුවීම සඳහා කුඩා ඉඩම්හිමි ගොවියන් හට සහය වීම සඳහා දේශ හවුල්කාරිත්ව උපායමාර්ග (CPS) වලට අදාළ වෙමින් කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය සඳහා අරමුදල් සැපයීමට එකගතාවය පළකොට ඇත. අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලය වසර 05 ක් වන අතර, ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 58.63 ක් වේ.

ඒ අනුව, ඌව පළාතේ, පළාත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා ඌව පළාත් ප්‍රධාන ලේකම් විසින්, 2019.03.05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව, අදාළ සුදුසුකම් හා පළපුරුද්ද සහිත අයදුම්කරුවන් වෙතින්, ඌව පළාත් ප්‍රධාන ලේකම් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. අධීක්ෂණ හා ඇගයුම් විශේෂඥ (PS 3) තනතුරු 01 (මොණරාගල සේවා ස්ථානය)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බව පිළිගත් වෙනත් සුදුසුකම්

**හෝ**

පිළිගත් වෘත්තීය ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම / වෙනත් සමාන සුදුසුකම්,

**සමග**

කළමනාකරණ තලයේ අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කිරීම,

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ වෙනත් සුදුසුකම්

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීයවේදී ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / වෙනත් ඊනැම සමාන සුදුසුකමක්

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ, පශ්චාත් උපාධියක් හෝ පිළිගත් වෘත්තීයවේදී ආයතනයක ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීයවේදී සුදුසුකමක්

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ, කළමනාකරණ මට්ටමේ අඩුම තරමින් වසර 08 ක පශ්චාත් යෝග්‍යතා පළපුරුද්ද.

03. රජයේ දිපවයාප්ත සේවාවන්හි 1 වන පන්තියේ නිලධාරියෙකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයේ තනතුරක් දරා සිටීම

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ 1 වන පන්තියේ තනතුරක අඩුම තරමින් වසර 03 ක පළපුරුද්ද

### 02. කළමනාකරණ සහකාර - තනතුරු 01 (මොණරාගලහි පදනම් ගතව)

I. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය එකම වතාවකදී සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂා සහ ගණිතය, ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් (04) සහිතව විෂයයන් හයකින් (06) සමත් වීම

**සහ**

අ.පො.ස. (උසස් පෙළ) විභාගය (සාමාන්‍ය පොදු ප්‍රශ්නපත්‍රය හැර) සියලුම විෂයයන් ගෙන් එකම වතාවකදී සමත්වීම හෝ පැරණි විෂය නිර්දේශය විෂයයන් තුනකින් (03) කින් සමත්වීම.

II. වයස අවුරුදු 18 ට නොඅඩු සහ වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට)

**තෝරාගැනීම** : සුදුසුකම් හා පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තු ගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

**වැටුප් පරිමාණය** : වැටුප් 2019.03.15 වන දින හා අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මත පදනම් වනු ඇත.

**සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි හා නියමයන් :**

රජයේ සේවාවන්හි දැනටමත් නියුතු අයදුම්කරුවන්, ද්විතීය පදනම මත බඳවා ගනු ලබන අතර, රජයේ සේවයෙන් බැහැර (පිටත) අයදුම්කරුවන්, කොන්ත්‍රාත්තු පදනම මත බඳවා ගනු ලැබේ. සියලුම පත්වීම් මූලිකව එක් (01) වසරක කාල සීමාවකට වන අතර, තනතුරු සේවා දීර්ඝ කිරීම තනතුරු ධාරියාගේ සාර්ථක කාර්ය සාධනය මත පදනම් වනු ඇත.

**අයදුම්පත් :**

සියලුම අයදුම්කරුවන් වෙතින් ස්වකීය අයදුම්පත් 2020 නොවැම්බර් 10 වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ බදුල්ල, ඌව පළාත් සභාවේ, ප්‍රධාන ලේකම් කාර්යාලයේ. ප්‍රධාන ලේකම් වෙත ලියාපදිංචි තැපැලෙන් එවීම සිදුකළ යුතු වන අතර, එම අයදුම්පත් සමග සියලු සහතිකවල පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපින, දුරකථන අංක ආදිය සහිතව සිය ජීව දත්ත තොරතුරු ප්‍රකාශ (CV) සම්පූර්ණකර ඉදිරිපත් කළ යුතුය.

දැනටමත් රජයේ / අර්ධ රාජ්‍ය සේවාවන්හි නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය අදාළ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර හා ව්‍යාපෘතියේ නම, පැහැදිලිව සටහන් කළ යුතුය.

**ප්‍රධාන ලේකම්,**
**ඌව පළාත් සභාව.**